# ඇමරිකන් එක්සත් ජනපද  තානාපති කාර්යාලය
# කොළඹ
# ප්‍රවෘත්ති නිවේදනය
මහජන කටයුතු අංශය

දුරකථනය:  +94 (1) 249-8100          ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපැල: VanHornNT@state.gov          http://lk.usembassy.gov

නිවේදන අංක: 01122019

නීති විරෝධී පුද්ගල ප්‍රවාහනය වැළැක්වීමට එක්සත් ජනපදය
ශ්‍රී ලංකාවට ආධාර කරයි

ජනවාරි 19,කොළඹ:  නීති විරෝධි පුද්ගල ප්‍රවාහනය වැළැක්වීම සඳහා ඊළඟ අවුරුදු තුන ඇතුළත එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට රුපියල් මිලියන 183ක (ඩොලර් මිලියන 1.2) ආධාර ලබා දෙනු ඇත. "නීති විරෝධි පුද්ගල ප්‍රවාහනය වැළැක්වීමට ශ්‍රී ලංකාව සන්නද්ධ කිරීම (EQUIP)" නම් නව ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ  දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ කාර්යාංශය මගින් අන්තර්ජාතික කම්කරු සංවිධානයේ  (ILO) ශ්‍රී ලංකා හා මාලදිවයින් කාර්යාලයට  මෙම ප්‍රදානය  ලබා දෙනු ඇත.

ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති  අතුල් කෙෂප්  මෙම ප්‍රයත්නය අගය කරමින් මෙසේ ප්‍රකාශ කළේය. "වර්තමාන වහල් ක්‍රමයේ හේතු නිරාකරණය කිරීමටත් වින්දිතයන් ආරක්ෂා කිරීමටත්  අන්තර්ජාතික හවුල්කරුවන් සමග කටයුතු කරමින්  එක්සත් ජනපදය ප්‍රබල කැපවීමක් පෙන්නුම් කර තිබේ. මෙම (EQUIP) ව්‍යාපෘතිය මගින් නීති විරෝධි පුද්ගල ප්‍රවාහනයේ ව්‍යසනය වැළැක්වීමට  අපි ශ්‍රී ලංකා රජයට දිගටම ආධාර කරමු"

අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා හා මාලදිවයින් කාර්යාලයේ  අධ්‍යක්ෂ සිම්රින් සිං ප්‍රකාශ කළේ "මෙය නීති විරෝධි පුද්ගල ප්‍රවාහනය වැළැක්වීමේ කටයුතු ශක්තිමත් කිරීමට අන්තර්ජාතික කම්කරු සංවිධානය හා ශ්‍රී ලංකාවට ලැබුණු කාලෝචිත ආධාරයක්" බවයි. "සාධාරණ බඳවා ගැනීම් පිළිබඳ  කම්කරු සංවිධානයේ සුප්‍රසිද්ධ මෙවලම් හා බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ  සම්මුති හා ප්‍රොටොකෝල්වල අඩංගු නිර්දේශ  භාවිතය තුළින් ජාතික හා බිම් මට්ටමේ  මෙම අභියෝගය ජය ගැනීමට ධනාත්මක බලපෑමක් කෙරෙනු ඇත."

නීති විරෝධී පුද්ගල ප්‍රවාහනයෙන් පීඩාවට පත් පිරිමින්. ගැහැණුන් හා දරුවන්ට  මෙම ව්‍යාපෘතිය  සෘජුව ම ආධාර කරනු ඇත. ප්‍රතිපත්ති සම්පාදකයන්, නීති බලාත්මක කරන්නන්, බඳවා ගන්නා නියෝජිතයන්, වෘත්තිය සමිති මෙන් ම ව්‍යාපාර ඇතුළු  'විපර්යකාරකයන්' සමග සමීපව කටයුතු කරමින් මෙම මැදිහත් වීමේ බලපෑම වැඩි කිරීමටත්. කල් පවතින වෙනසක් ළඟා කර ගැනීමටත්  මෙම ව්‍යාපෘතිය (EQUIP) ක්‍රියා කරනු ඇත.